# 2011 දේශපාලන ලෝකය දෙස ආපසු හැරී බලමු




## සැප්තැම්බර්-ත්‍රස්තවාදය මර්ධනයට නව සංවිධානයක්

වසර හතලික් ලිබියාවේ අසහාය නායකයා ලෙස වැජඹුණු කර්නල් මුහම්මර් ගඩාෆිගේ පාලනය යටතේ පැවති අවසන් බලකොටුව මෙන්ම ඔහුගේ උපන් ගම් ප්‍රදේශය වන සර්තේ ප්‍රදේශයත් කැරලිකරුවන් විසින් අත්පත්කරගැනීමත් සමඟ ගඩාෆි අතුරුදහන් විය. ගඩාෆිට යටත්වන ලෙස කැරලිකාර පාර්ශ්වයෙන් කෙරුණු ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් ඔහු සැප්තැම්බර් 01 දා සිරියානු රූපවාහිනී නාලිකාවකට කියා තිබුණේ තමන් කිසි විටෙකත් යටත් වන්නට හෝ රටහැර යන්නට සූදානම් නැති බවත් ගරිල්ලා යුද්ධයක් අරඹමින් සෑම නිවෙසකම, සෑම ගමකම යුද ගිනි අවුළුවන බවත්ය. ඒ වන විට ගඩාෆිගේ බිරිය සහ දරුවන් කීපදෙනෙකු රටහැර පලාගොස් සිටියහ. බාල පුතු අල් සාදි ද දේශපාලන රැකවරණ පතා සිය රටට පැමිණ සිටින බව නයිගර් රාජ්‍ය 11 වෙනිදා නිකුත් කළ නිවේදනයකින් කියැවිණ. පසුදා ලිබියා අන්තර්වාර පාලන මණ්ඩලයේ නායක ජිබ්රාල් ට්‍රිපොලි නුවරදී ජාතිය අමතමින් ප්‍රකාශ කළේ දින 10 ඇතුළත ලිබියාවේ නව රජයක් පිහිටුවන බව බවය.

මේ අතර ඇමරිකාව අල්-ක්වයිදා සංවිධානයට එරෙහිව කරගෙන යන යුද්ධයේ තවත් ජයග්‍රහණයක් අත්කර ගන්නට සමත්විය. 16 වෙනිදා මාධ්‍ය වාර්තා කර තිබුණේ අල්-ක්වයිදා සංවිධානයේ පාක-ිස්ථාන් මෙහෙයුම් ප්‍රධානී අබු හෆාස් අල් ෂහීර් වසිරිස්ථානයේ සැගව සිටියදී ඇමරිකාව නියමුවන් රහිත ඩ්‍රෝන යානා යොදාගෙන එල්ල කළ මිසයිල ප්‍රහාරයකින් මරා දැමූ බවය.

ශ්‍රීලාල් සෙනෙවිරත්න

යුරෝපා සංගමය ප්‍රමුඛ රටවල් 29 ක් එක්ව ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියාකිරීමට 'ගෝලීය ත්‍රස්ත මර්ධන සංවිධානය' නමින් නව සංවිධානයක් පිහිටුවාගැනීම සැප්තැම්බර් මාසයේ සිදුවූ තවත් විශේෂ සිදුවීමකි. 22 දා මේ සංවිධානය පිහිටුවා ගැනීමෙන් දින තුනකට පසු එක්සත් ජාතීන්ගේ 66 වන වාර්ෂික සමුළුව පැවැත්වෙන අතරතුර සන්නද්ධ කල්ලිවලට සහ හමුදාවලට ළමා සොල්දාදුවන් බඳවා ගැනීම තහනම් කිරීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියට තවත් රටවල් කීපයක් අස්සන් තැබුවේය. ඇන්ගෝලාව, ආමේනියාව, බොස්නියාව, කොස්ටාරිකා සහ සැන් මැරීනා යන රටවල් මෙලෙස අස්සන් තැබීමත් සමග එම සම්මුතියට අස්සන් කළ රටවල් සංඛ්‍යාව 100 දක්වා ඉහළ ගියේය.

## ඔක්තෝබර්-යුද සිරකරුවන් හුවමාරුවේ ඓතිහාසික අවස්ථාවක්

යුද වැදී සිටින දෙපාර්ශ්වයන් අතර සිරකරුවන් හුවමාරු කරගැනීමේ ඓතිහාසික අවස්ථාවක් සනිටුහන් කෙරුණු මාසයකි. හමාස් සංවිධානය අත්අඩංගුවට ගෙන සිටි සිය සෙබලෙකු නිදහස් කරගැනීම වෙනුවෙන් ඊශ්‍රායලය තමන් භාරයේ සිටි පලස්තීන ජාතික සිරකරුවන් 477 දෙනෙකු නිදහස් කළේය. ඊශ්‍රායලය විශාල වන්දියක් ගෙවමින් මෙලෙස නිදහස් කරගනු ලැබුවේ වසර පහකට පමණ පෙර ගාසා තීරයේදී හමාස් අත්අඩංගුවට පත්ව සිටි ගිලාඩ් ෂාලිඩ් නමැති සෙබළෙකි.
වසර 42ක් ලිබියාව පාලනය කළ මුවම්මර් ගඩාෆි සිය උපන්ගම වන සර්ටේහි සැගවී සිටියදී කැරලිකාර පාර්ශ්වයේ සෙබළුන් විසින් මරා දැමුණේ 21 වෙනිදාය. ගඩාෆිගේ පුතෙකු වන මුටාසිම්ද එලෙසම මරාදැමුණි.

ගඩාෆිගේ රජයේ ජාතික ආරක්ෂක උපදේශකවරයාද වූ මුටාසිම් ගඩාෆි කැරලිකරුවන්ගේ අත්අඩංගුවට පත්වූයේ 13 වෙනිදාය. මෝටර් රියක නැගී පලායාමට උත්සාහ කරද්දී සර්තේ ප්‍රදේශය අල්ලා ගැනීමට සටන්කරමින් සිටින කැරලිකරුවන් විසින් මුටාසිම් අල්ලා ගනු ලැබ තිබිණ. මේ දෙදෙනාගේ සිරුරු කාන්තාරයේ රහසිගත ස්ථානයක මිහිදන් කළ බව ලිබියා අන්තර්වාර පාලන මණ්ඩලය පසුව ප්‍රකාශ කළේය. ඒත් සමඟ ලිබියාවේ සිවිල් යුද්ධය අවසානය කරා පැමිණියේය. ලිබියාවේ සිදුකළ සිය මෙහෙයුම් සහ ප්‍රහාර අවසන් කළ නේටෝ හමුදා ඒ බව සංකේතවත් කරමින් 31 දා මධ්‍යම රාත්‍රියේ ඔවුන්ගේ අවසන් වෙඩි මුරය ලිබියා ගුවන් ගැබට නිකුත් කළේය.




## නොවැම්බර්-ඊජිප්තුවේ ගිම්හානය

ගරිල්ලා ත්‍රස්තවාදී සංවිධානයක් වන කොලොම්බියානු විප්ලවීය හමුදාවේ නායක ඇල්ෆොන්සෝ කැනෝ කොලෙම්බියා හමුදා ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්වූයේ නොවැම්බර් 05 වෙනිදාය. වසර පනහක පමණ කාලයක සිට කොලොම්බියානු රජයේ හමුදා සහ කැනෝගේ විප්ලවීය හමුදාව අතර ගැටුම් පැවැති අතර ඒ කාලය තුළ දෙපාර්ශ්වයේ ප්‍රහාරවලට ලක්වීමෙන් හතලිස් දහසක් පමණ මියගොස් තිබිණ.

'අරාබි වසන්තය' උදා නොවුණද ඉතාලි රජයේ අගමැති සිල්වියා බර්ලුස්කෝනි නොවැම්බර් 12 වෙනිදා සිය ධුරයෙන් ඉල්ලා අස්විය. දූෂිතයකු සහ සල්ලාලයකු බවට හංවඩු ගසනු ලැබ සිටින කෝනිගේ ඉල්ලා අස්වීමත් සමඟ රෝම අගනුවරට රැස්වූ දහස් ගණන් ජනතාව ප්‍රීතිඝෝෂා පැවැත්වූහ.

'අරාබි වසන්තය' ට ගොදුරු වූ තවත් රටක් වූ කුවේටයේ අගමැති ශික් නසාර් සහ ඔහුගේ ඇමැති මණ්ඩලය 28 වෙනිදා ඉල්ලා අස්වූහ. වසර පහක් තුළ මෙලෙස බලය අතහැරීමට සිදුවූ කුවේටයේ පස්වෙනි කැබිනට් මණ්ඩලය එය විය. කුවේට් අගමැතිවරයාට එරෙහිව ජනතාව වීදි බසින්නට පටන් ගත්තේද 'අරාබි වසන්තය' ආරම්භයේදීය. අගමැති ශීක් නයාර්ගේ නිල නිවෙස ඉදිරියේ විරෝධතා දැක්වූ විරෝධතාකරුවෝ 17 වෙනිදා එරට පාර්ලිමේන්තුවට ද කඩා කළබල කළහ. වසන්තයෙන් පසුව අරාබි රටවලට ගිම්හානයක් උදාවනු ඇත්දැයි සැක උපදවන සිදුවීක් 21 දා ඊජිප්තුවෙන් වාර්තා විය.
'අරාබි වසන්තය' ආරම්භයේදීම ජනපති හොස්නි මුබාරක් ධුරය අතහැර රාජ්‍ය පාලනය හමුදා බාරකාර මණ්ඩලයකට පැවරුවේය. එතැන් සිට රට පාලනය කෙරුණේ ඒ බාරකාර මණ්ඩලය යටතේය. 21 දා ඒ කැබිනට් මණ්ඩලයට ද ඉල්ලා අස්වූයේ ඊට එරෙහිව ද ජනතා විරෝධතා මතුවීම හේතුවෙනි.

## දෙසැම්බර්-පුටින් වැටෙයි

රුසියාවේ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පාලක පක්ෂයට අපෙක්ෂිත ජය අහිමිවිය. 2007 වසරේ පැවැති මැතිවරණයෙන් 64.3% ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන විශිෂ්ඨ ජයක් හිමිකරගෙන සිටි ජනපති පුටින්ගේ එක්සත් රුසියානු පක්ෂයට මෙවර හිමිව තිබුණේ 51% පමණ වැඩි ඡන්ද ප්‍රමාණයකි. ගතවූ වසර 12 ක පුටින්ගේ පාලනය සම්බන්දයෙන් ජනතාව දක්වා ඇති මේ ප්‍රතිචාරය එළැඹෙන මාර්තු මාසයේ ජනාධිපතිවරණයට නැවත ඉදිරිපත්වීමට සිටින පුටින් ලද නරක සංඥාවක් විය. සෝවියට් රුසියාවේ පාලන බලය දැරූ කොමියුනිස්ට් පක්ෂය මෙවර මැතිවරණයෙන් නැවත ඉදිරියට පැමිණ තිබුණි. දෙසැම්බර් 05 වෙනිදා මොස්කව් නුවර වීදි බට දහස් ගණන් ජනතාව පවතින් මැතිවරණ ක්‍රමයට එරෙහිව විරෝධතා දැක්වූ අතර සියයකට අධික පිරිසක් එහිදී පොලිස් අත්අඩංගුවට පත්විය.

2011 වසර පුරාම ඉරානය පසුවූයේ ඇමරිකාව ප්‍රමුඛ බටහිර ලෝකයෙන් එල්ල විය හැකි ප්‍රහාරයක අවදානම හමුවේය. වසර අවසාන වන විට එය ඉතා නරක අතට හැරෙමින් තිබිණ. ඉරානයේ බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයට එරට ජනතාව පහරදීම හේතුවෙන් සිය තානාපති කාර්ය මණ්ඩලය ආපසු කැදවීමට බ්‍රිතාන්‍ය පියවර ගත්තේය. එතැකින් නොනැවතුණ බ්‍රිතාන්‍ය දෙරට අතර තානාපති සබඳතා අවසන් කරමින් සිය රටේ තිබූ ඉරාන තානාපති කාර්යාලය වසාදමා තානාපතිවරයා රටින් නෙරපා හැරියේය. මේ සිද්ධියම මුල්කරගනිමින පසුව ප්‍රංශයද සිය ඉරාන තානාපති කාර්ය මණ්ඩලය ආපසු කැඳවීය. ඉරානය න්‍යෂ්ඨික බෝම්බ නිපදවන බව කියමින් ඇමරිකාව කලකට පෙර ඉරාකය ආක්‍රමණය කිරීමට පෙර වාදනය කළ තැටිය නැවත නැවතත් වාදනය කරමින් සිටියි. ඉරානයට එරෙහිව විවිධ සම්බාධක පවා පනවා තිබුණද බටහිර හමුවේ දන නමන්නට ඉරානය සූදානම් නොවීම වසර පුරා බටහිරට ඉවසුම් නොදෙන තත්ත්වයක් විය.

